www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම
Second term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ................................................................................ විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

❖ අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දික්සඳ පිරිවෙන් වාසී මහානාම හිමි රචනා කරන ලද සාහිත්‍යමය මූලාශ්‍රයක් වන්නේ,

(1) දීපවංසය (2) මහාවංසය (3) ථූපවංසය (4) සද්ධර්මරත්නාවලිය

(02) ක්‍රිස්තුස් වහන්සේගේ උප්පත්තියෙන් පසු කාලය හඳුන්වන්නේ,

(1) ශක වර්ෂ නමිනි. (2) බුද්ධ වර්ෂ නමිනි.
(3) ක්‍රිස්තු වර්ෂ නමිනි. (4) ක්‍රිස්තු පූර්ව නමිනි.

(03) ඉස්ලාම් ආගමේ නායකයා මක්කම සිට මදීනාවට පැමිණීම හා සම්බන්ධ වනුයේ කුමන වර්ෂ ක්‍රමය ද?

(1) බුද්ධ වර්ෂ (2) හිජ්රි වර්ෂ (3) ක්‍රිස්තු වර්ෂ (4) ශක වර්ෂ

(04) මානව පරිණාමය ලෙස හැඳින්වූයේ,

(1) මහා හිම යුගයේ මිනිසුන් බිහිවීමේ ක්‍රියාවලියයි.
(2) සත්ත්ව පරිණාමයයි.
(3) වානර පරම්පරාවට අයත් චිම්පන්සියකුගේ මිනිසකු ලෙස දියුණු වීමේ ක්‍රියාවලියයි.
(4) පෘථිවියේ ජීවීන් බිහිවීමයි.

(05) මිනිසකු වීමට නැඹුරුවක් ඇතිකළ පැරණිම මානවයා හැඳින්වූයේ,

(1) හෝමෝ ඉරෙක්ටස් ය. (2) ඔස්ට්‍රලෝපිතිකස් ය.
(3) හෝමෝ හැබිලස් ය. (4) හෝමෝ සාපියන් ය.

(06) - මොහු ජීවත් වූයේ මීට අවුරුදු හයලක්ෂයකට ඉහත දී ය.
- සතුන්ගේ ඇටකටු භාවිතාකර නිවාස ඉදි කළේ ය.
- එළවලු වර්ග පිස ආහාරයට ගෙන තිබේ.

ඉහත තොරතුරු අදාළ වන්නේ කවර මානව වර්ගයාට ද?

(1) හෝමෝ නියැන්ඩතාලන්සිස් ය. (2) හෝමෝ ඉරෙක්ටස් ය.
(3) හෝමෝ හැබිලස් ය. (4) ඔස්ට්‍රලෝපිතිකස් ය.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


(07) බොහෝ සාරවත් දේ නිපදවූ මානවයා හැඳින්වූයේ,
(1) හොමෝ සාපියන් යනුවෙනි. (2) හෝමෝ ඉරෙක්ටස් යනුවෙනි.
(3) හෝමෝ හැබිලස් යනුවෙනි. (4) ඔස්ට්‍රලෝපිතිකස් යනුවෙනි.

(08) වී වගාව මුල් වරට ආරම්භ වූ රට ලෙස සැලකෙන්නේ,
(1) ලංකාවයි. (2) ඉන්දියාවයි. (3) මෙක්සිකෝවයි. (4) චීනයයි.

(09) දුප්පත් හා පොහොසත් යන බෙදීම මුල්වරට ඇතිවූයේ,
(1) පුරා ශිලා යුගයේ දී ය. (2) නව ශිලා යුගයේ දී ය.
(3) මධ්‍ය ශිලා යුගයේ දී ය. (4) දඩයම් යුගයේ දී ය.

(10) අප ආහාරයට ගන්නා "බඩඉරිඟු" මුල්වරට වගා කළ ප්‍රදේශය වන්නේ,
(1) චීනයයි. (2) මෙක්සිකෝවයි. (3) මධ්‍යධරණී ප්‍රදේශයි. (4) අප්‍රිකාවයි.

(11) මානවයින්ගේ හිස් කබල්වල ස්වරූපය අනුව මෙහි දක්වා ඇති මානවයා හඳුන්වන්නේ,



(1) ඔස්ට්‍රලෝපිතිකස් යනුවෙනි.
(2) හොමෝ හැබිලස් යනුවෙනි.
(3) හෝමෝ ඉරෙක්ටස් යනුවෙනි.
(4) නියැන්ඩතාලන්සිස් යනුවෙනි.

(12) වෙඩිබෙහෙත්, මාලිමා යන්ත්‍රය මුලින් ම ලෝකයට හඳුන්වා දෙන ලද්දේ,
(1) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි. (2) ඊජිප්තු ශිෂ්ටාචාරයයි.
(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (4) චීන ශිෂ්ටාචාරයයි.

(13) මෙසපොතේමියානු ශිෂ්ටාචාරවාසීන් පොළොවට අධිපති දෙවියන් ලෙස හැඳින්වූයේ,
(1) එන්කිකි ය. (2) අනූ ය. (3) එන්ලිලී ය. (4) සිගුරාට් ය.

(14) ථූපාරාමයට වටදාගෙයක් ඉදිකරවූයේ කුමන රජතුමා ද?
(1) වලගම්බා රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) දේවානම්පියතිස්ස රජතුමා ය. (4) වසභ රජතුමා ය.

(15) විජය කුමරු මෙරටට ගොඩබට ස්ථානය හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) තම්බපන්ණිය (2) ගෝකණ්ණ (3) මහා තිත්ථ (4) ජම්බුකෝලපට්ටන

(16) ථූපාරාම දාගැබ මුල් වරට ඉදිකරන ලද්දේ කුමන හැඩයකින් ද?
(1) ධාන්‍යාකාර (2) බුබ්බුලාකාර (3) ඝණ්ටාකාර (4) ඝටාකාර

(17) නයිල් ගංගාව මුල් කරගෙන ඇරඹුනු ශිෂ්ටාචාරය කුමක් ද?
(1) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (2) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය
(3) ඊජිප්තු ශිෂ්ටාචාරය (4) චීන ශිෂ්ටාචාරය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(18) මේ රට ජනාවාස කළ මිනිසුන් විසූ මුල් යුගය හැඳින්වෙන්නේ,
(1) හිම යුගය නමිනි. (2) දඩයම් යුගය නමිනි.
(3) එඬේර යුගය නමිනි. (4) ගොවි යුගය නමිනි.

(19) පණ්ඩුකාභය රජතුමාගේ පුතා වූයේ කුමන රජතුමා ද?
(1) දේවානම්පියතිස්ස රජු ය. (2) මුටසීව රජු ය.
(3) වසභ රජු ය. (4) දුටුගැමුණු රජු ය.


(20) දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදිකරන ලද දානශාලාව හැඳින්වූයේ,
(1) ලහබත්ගේ නමිනි. (2) මහබෝගෙය නමිනි.
(3) තිස්සාරාමය නමිනි. (4) මහාවිහාරය නමිනි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
* අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (I) (i) මෙම පින්තූරයෙන් නිරූපණය වන්නේ කුමන පුද්ගලයෙක් ද?
(ii) මෙම නිර්මාණය අයත්වන්නේ කුමන ශිෂ්ටාචාරයට ද?
(iii) මොහුගේ තත්වය පෙන්නුම් කරන සංකේතය කුමක් ද?
(iv) මෙහි ඇති විශේෂ ලක්ෂණයක් ලියන්න.
(ලකුණු 02 x 4 = 08 )



(II) පහත සඳහන් දේ අයත්වන්නේ කුමන ශිෂ්ටාචාරයකටදැයි ලියන්න.
(i) සෙල්ලම් මැටි කරත්තය -
(ii) කූනාග අක්ෂර -
(iii) පිරමීඩ -
(iv) නෙපටිටි රැජින - (ලකුණු 04)

(III) පහත A, B, C, D අක්ෂරවලින් දැක්වෙන මානව වර්ගය නම් කරන්න.

A

B

C

D


(ලකුණු 04)




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(02) (i) ලෝකයේ මුල්වරට ජීවීන් බිහිවූයේ කුමන ස්ථානවල ද? (ලකුණු 02)

(ii) A. පළමු වරට ගොඩබිම පහළ වූ සත්ත්ව වර්ගය නම් කරන්න.

B. එම සතුන් බිහිවූ යුගය නම් කරන්න. (ලකුණු 04)

(iii) නව ශිලා යුගයේ මිනිසාගේ හැකියාවන් පිළිබඳ වාක්‍යය පහක් ලියන්න. (ලකුණු 05)

(03) (i) මානව පරිණාමය අනුව අප සියලුදෙනා අයත් වන්නේ කුමන මානව වර්ගයට ද? (ලකුණු 02)

(ii) මුල් කාලීනව අප රටේ වාසය කළ මානවයින් ආහාරයට ගෙන ඇති දේවල් හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) මුල් යුගයේ මිනිසාගේ අවමංගල චාරිත්‍ර ඉටු කළ ආකාරය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

(04) (i) A. ලෝකයේ පැරණිතම සාහිත්‍ය කෘතිය

B. ලෝකයේ පැරණිතම නීති පොත

ලියන ලද්දේ කවුරුන් විසින්දැයි ලියන්න. (ලකුණු 02)



(ii) i. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

ii. මෙහි ඇති අක්ෂර හඳුන්වන නම දක්වන්න. (ලකුණු 04)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු නාගරික ලක්ෂණවලින් තිබූ බව පෙන්වන සාධක පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(05) (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය බිහිවීමට මුල් වූ ගංගා දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) චීන ශිෂ්ටාචාර වැසියන් ලොවට හඳුන්වා දුන් දායාද දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ කෘෂිකර්මාන්තය පිළිබඳ වාක්‍ය පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

(06) (i) මළ සිරුරු කල් තබා ගැනීමේ මමීකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දුන් ශිෂ්ටාචාරය නම් කරන්න. (ලකුණු 02)

(ii) ඊජිප්තු චිත්‍රාක්ෂර යනු මොනවාදැයි කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

(iii) A. ඊජිප්තුවේ අගනුවර වූ කයිරෝ නගරය ආසන්නයේ ඇති පිරමීඩයේ නම කුමක් ද?

B. ඒ තුළ තැන්පත් කර ඇත්තේ මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) අතීතයේ ශ්‍රී ලංකාවෙ හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලයේ සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය නිර්මාණය කළ ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk